මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு
MINISTRY OF FINANCE, PLANNING AND ECONOMIC DEVELOPMENT

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01, இலங்கை.
The Secretariat, Colombo 01, Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 -2484500, 011- 2484600, 011- 2484700
ෆැක්ස් / தொலை நகல் / Fax: 011- 2449823
වෙබ් අඩවිය / இணைய தளம் / Website: www.treasury.gov.lk

**ප්‍රවෘත්ති නිවේදනය**

## <u>අපනයන හා ආනයන ක්‍රියාවලියට සම්බන්ධ අනුමැතීන්ගේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම.</u>

දේශීය අපනයනකරුවන් සඳහා සහ දේශීය කර්මාන්තවලට අවශ්‍ය අමුද්‍රව්‍ය ආනයනකරුවන් වෙත අවශ්‍ය සේවා සම්බන්ධයෙන් කාර්යක්ෂම ආකාරයෙන් පහසුකම් සැලසීම සහතික කිරීම පිණිස, රජය විසින් ජාතික තනි කවුළු (Single Window) පහසුකමෙහි වැදගත්කම හඳුනාගෙන තිබේ. මේ සම්බන්ධයෙන් මෙතෙක් සිදුකර ඇති කටයුතුවල ප්‍රගතිය අදාළ පාර්ශව සමඟ හුවමාරු කරගැනීම සඳහා මෑතක දී පවත්වන ලද රැස්වීමේ දී, 2025 ජනවාරි 01 වැනි දින සිට අවශ්‍ය සේවා මාර්ගගතව සැපයීම ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව විසින් ආරම්භ කර ඇති බව ගරු නියෝජ්‍ය මුදල් අමාත්‍ය ආචාර්ය හර්ෂණ සූරියප්පෙරුම මහතා විසින් වාණිජ මණ්ඩල නියෝජිතවරුන්ට දන්වන ලදී. තව ද, අපනයනකරුවන් සහ ආනයනකරුවන් සඳහා අවශ්‍ය සේවා ශ්‍රී ලංකා ප්‍රමිති කාර්යාංශය විසින් මාර්ගගත ආකාරයෙන් ලබාදෙන බව එහි දී දැනුවත් කෙරිණි.

විවිධ මට්ටම්වල කාර්ය සාධනය සමඟින් තවත් ආයතන කිහිපයක් සේවා සැපයුම සඳහා මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ පහසුකම් සැලසීම දැනටමත් ආරම්භ කර තිබේ. මේ වනවිට මෙම ජාතික තනි කවුළු ව්‍යාපෘතිය සමඟ දැනට සම්බන්ධ වී සිටින වාණිජ මණ්ඩල පහක්, එනම් ලංකා වාණිජ මණ්ඩලය, ජාතික වාණිජ මණ්ඩලය, අපනයනකරුවන්ගේ ජාතික මණ්ඩලය, වාණිජ සහ කර්මාන්ත මණ්ඩල සම්මේලනය සහ ජාත්‍යන්තර වාණිජ මණ්ඩලය විසින් මෙම පහසුකම් සැලසීම අගය කරන ලදී.

තෝරාගත් රජයේ ආයතන කිහිපයක් සිය සේවා ඩිජිටල් ආකාරවලින් සැපයීම ඔස්සේ රාජ්‍ය ආයතනවලට අපනයන හෝ ආනයනකරුවන් පැමිණීමකින් තොරව සිය අනුකූලතාවය සහ අනෙකුත් අවශ්‍යතා සපුරාලීමේ අවස්ථාවක් අපනයනකරුවන් සහ ආනයනකරුවන් වෙත ලබා දීමට මේ තුළින් අරමුණු කෙරේ.

මාර්ගගත ආකාරයෙන් සිය සේවා පවත්වාගෙන යෑම සම්බන්ධයෙන් අදාළ ආයතන විසින් අත්පත් කරගෙන ඇති ප්‍රගතිය සම්බන්ධයෙන් ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා සහ රැස්වීම සඳහා සහභාගී වූ පිරිස

සාකච්ඡා කරන ලද අතර, ජාතික තනි කවුළු පද්ධතිය පූර්ණ වශයෙන් ක්‍රියාත්මක වන තෙක් ප්‍රමුඛතාවය ලබා දී ක්‍රියාත්මක කළ යුතු කරුණු සම්බන්ධයෙන් වාණිජ මණ්ඩල පහේ අදහස් සහ නිරීක්ෂණ ඉල්ලා සිටින ලදී. 2017 සිට මේ දක්වා ලබා ඇති ප්‍රගතිය ඉතා සීමිත මට්ටමක පවතින බව රැස්වීම සඳහා සහභාගීවූ පිරිස විසින් අවධානයට ලක් කළ අතර, එබැවින් අපනයනකරුවන් සහ ආනයනකරුවන් සඳහා තරගකාරී වාසියක් ලබාගැනීම පිණිස ඔවුන්ගේ අවශ්‍යතා සඳහා පහසුකම් සැලසීමට ප්‍රමුඛතාවය ලබාදීම වැදගත් වේ. 2022 ජූනි මස ලැබී ඇති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ඒකකයක් ස්ථාපනය කරන ලද අතර, එහි ප්‍රගතිය සම්බන්ධයෙන් ද සාකච්ඡා කෙරුණි.

නිෂ්පාදන ආර්ථිකයක් සඳහා පහසුකම් සැලසීම සහ අපනයන කාර්යයන් ඉහළ මට්ටමකට ගෙන යෑම මෙන්ම නිෂ්පාදකයන් සහ පාරිභෝගිකයන් සම්බන්ධයෙන් සැලකූ විට එම පිරිසට කාර්යක්ෂම ලෙස ආනයන කටයුතු සහතික කිරීමේ අරමුණින් යුතුව අදාළ පාර්ශවකරුවන් විසින් මෙහි ඉදිරි කටයුතු සම්බන්ධයෙන් පැහැදිලි දැක්මක් සහ අවබෝධයක් ලබාගන්නා තුරු සහ අදාළ ආයතන විසින් අපේක්ෂිත ප්‍රගතිය අත්පත් කරගන්නා තුරු මෙම ව්‍යාපෘතියේ කටයුතු සමඟ අඛණ්ඩව සම්බන්ධ වන ලෙස ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා වාණිජ මණ්ඩල පහේ නියෝජිතවරුන් වෙත ආරාධනා කරන ලදී.

ඉහත කරුණු සම්බන්ධයෙන් සියලු මාධ්‍ය ආයතන දැනුවත් කිරීමට කටයුතු කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි. මේ සම්බන්ධයෙන් ඔබ දක්වන සහයෝගය ඉතා අගයකොට සලකමි.

වජිරා බස්නායක,

ගරු මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගේ

මාධ්‍ය ලේකම්

වජිරා බස්නායක
ගරු මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන
අමාත්‍යතුමාගේ මාධ්‍ය ලේකම්

0777-556266

2025.01.07

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு
MINISTRY OF FINANCE, PLANNING AND ECONOMIC DEVELOPMENT

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව. | செயலகம், கொழும்பு 01, இலங்கை. | The Secretariat, Colombo 01, Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011-2484500, 011-2484600, 011-2484700
ෆැක්ස් / தொலை நகல் / Fax: 011-2449823
වෙබ් අඩවිය / இணைய தளம் / Website: www.treasury.gov.lk

**Press Release**

## Review the Progress of National Single Window

To ensure efficient facilitation of services required by the exporters and importers of raw material for local industries, the Government has recognized the importance of the Single Window facilitation. During a recent meeting to share the progress made in this regard, Hon. Deputy Minister Finance Dr. Harshana Suriyapperuma informed the chamber representatives that Department of Imports and Exports Control has commenced providing the required services online from 1st January 2025. Further it was noted that Sri Lanka Standard Institution was already providing online services required by exporters and importers.

Several other agencies have commenced the online facilitation of services with varying degrees of progress. The five chambers: Ceylon Chamber of Commerce, National Chamber of Commerce, National Chamber of Exporters, Federation of Chambers of Commerce and Industries and International Chamber of Commerce who are currently engaged in the single window initiative, appreciated the facilitation.

Extending of services by the selected government agencies through digital means allow exporters and importers to meet the compliant and other requirements without physically visiting the government institutions.

The Hon. Deputy Minister and participants discussed the progress made by applicable agencies in respect to online availability of their services and requested the five chambers to submit their views and observations which could be used to prioritize the implementation until the National Single Window System is fully operationalized. Participants noted that limited progress was made since 2017 and therefore it is important to prioritize facilitate the needs of exporters and importers

Ministers in June 2022 the project implementation unit is under the Ministry of Finance and the consultation are ongoing.

The Hon. Deputy Minister invited the five Chambers to engaged continuously until the stakeholders have a good visibility of the way forward and the progress achieved by the agencies, to ensure the facilitation of a production economy and to take exports to a greater height as well as to ensure smooth facilitation of importation in the perspective of produces and consumers.


Vajira Basnayake,

Media Secretary to the Hon. Minister of

Finance, Planning and Economic Development

0777-556266


Vajira Basnayake

Media Secretary to the Hon. Minister of

Finance, Planning and Economic Development

2025.01.07